# 4 ශ්‍රී ලංකාවේ පැරණි සමාජය

**හැඳින්වීම**

ඕනෑ ම කාලයක ඕනෑ ම සමාජයක ජීවත් වන වැඩි පිරිස සාමාන්‍ය ජනතාව යි. පාලකයින්, රජයේ නිලධාරීන්, ආගමික නායකයින් සහ වෙනත් ප්‍රභූන් ආදින් ඒ අතර සිටින සුළු පිරිසකි. ඉතිහාසය යනු මේ සියලු දෙනාගේ ක්‍රියාකාරකම් පිළිබිඹු කරන අතීතය යි. කරුණ එසේ වුව ද බොහෝ ඓතිහාසික මූලාශ්‍රය වැඩි අවධානයකින් ඉදිරිපත් කර තිබෙන්නේ දෙවනුව කී සුළු පිරිසට අදාළ විස්තර යි. එහෙයින් අතීතයේ සාමාන්‍ය ජනතාව පිළිබඳ අප දන්නා තොරතුරු සීමිතය. අපේ රටේ ඉතිහාසය වඩා හොඳින් තේරුම් ගැනීමට නම් පුරාණ කාලයේ විසූ සාමාන්‍ය ජනතාවගේ ජීවිතය ගැන තොරතුරු ඉගෙන ගැනීම අවශ්‍ය ය. මෙම පාඩමෙන් මේ සියල්ල පිළිබඳ බොහෝ තොරතුරු දැන ගැනීමට ඔබට අවස්ථාවක් ලැබෙනු ඇත.

## 4.1 පාලනයේ ස්වරූපය

පුරාණ කාලයේ අප රට පාලනය කළේ රජවරුන් බව ඓතිහාසික මූලාශ්‍රය විස්තර කර තිබේ. එලෙස පාලනය ගෙන යාමේ දී අනුගමනය කළ රාජතාන්ත්‍රික පිළිවෙළ කුමක් ද යි යන කරුණ පැහැදිලි කරන ඉතා වැදගත් තොරතුරු සෙල්ලිපිවල සඳහන් ය.

ඕනෑ ම රටක පාලනය මෙහෙයවන ආයතන තුනක් තිබේ. ඒවා හැඳින්වෙන්නේ ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය යනුවෙනි. රජය යනුවෙන් අදහස් කරන්නේ මෙම ආයතන තුන යි. ව්‍යවස්ථාදායකය යනු රටක නීති සම්පාදනය කරන ආයතනය යි. වර්තමානයේ අපේ රටේ පාර්ලිමේන්තුව මඟින් එම කටයුත්ත ඉටු කරන්නා සේ පුරාණ කාලයේ එය ඉටු කරන ලද්දේ රාජසභාව විසිනි. විධායකය යනු නීති ක්‍රියාත්මක කරන ආයතනය යි. ඊට සම්බන්ධ වන්නේ රජයේ නිලධාරීන් ය. අධිකරණය මගින් නීති උල්ලංඝනය වීමෙන් සමාජයකට ඇති විය හැකි හානිය වළක්වා රටවැසියා වෙත යුක්තිය පසිඳලනු ලබයි.


පුරාණ කාලයේ අපේ රටේ විධායකයක් සහ අධිකරණයක් තිබිණි. ව්‍යවස්ථාදායකය ලෙස ක්‍රියාත්මක වූයේ ද විධායකය යි. ව්‍යවස්ථාදායක මණ්ඩලයක් ලෙස වෙන ම ස්වාධීන ආයතනයක් එකල නොවූයේ එසමයේ මෙරට පැවතියේ රාජාණ්ඩු ක්‍රමයක් වූ නිසා ය. විධායකය සහ ව්‍යවස්ථාදායකය හැඳින්වීමට ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවසේ ලියැවුණු සෙල්ලිපිවල යොදා තිබෙන්නේ *එක්තැන්සමිය* යන යෙදුම යි. අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් බුද්ධන්නේහෙල නම් ස්ථානයේ පිහිටි සෙල්ලිපියක "*අප මෙතුවාක් දෙනා අවුද් " වත්හිමියන් වහන්සේ වදාළ "එක්තැන් සමියෙන්"* යනුවෙන් කළ සටහනක් දක්නට තිබේ. එහි යෙදී තිබෙන "එක්තැන්සමිය" යන පදය සකස් වී තිබෙන්නේ *ඒක ආස්ථාන සාම්‍යය* යන පද ආශ්‍රයෙනි. *ඒක ආස්ථාන* යනුවෙන් හැඳින්වෙන්නේ රාජ සභාව යි. *සාම්‍යය* යන වචනයෙන් එකඟතාව යන තේරුම ලැබේ. එවිට *එක්තැන් සමිය* යනු රාජ සභාවේ එකඟතාව යන අදහස ලබා දෙයි. ඉහතින් සඳහන් කළ බුද්ධන්නෙහෙල සෙල්ලිපියේ පිහිටුවා තිබෙන්නේ ඉඩම් පූජාවක් ප්‍රකාශයට පත් කරනු පිණිස ය. එම දීමනාව පිරිනමන්නේ රාජ සභාවේ එකඟතාවෙන් රජු අණ කළ නිසා බව එම ලිපියේ සඳහන් පාඨයෙන් කියැවේ. *වත්හිමියන් වදාළ* යන පදයෙන් රජුගේ ආඥාව අදහස් කරයි. *වත්හිමි* යන පදය රජු හැඳින්වීමට යෙදූ එහි පර්යාය පදයකි.

ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවසට අයත් සෙල්ලිපිවල සඳහන් වන පරිදි රජයේ ඉඩම් බෞද්ධ විහාර වෙත පිරිනැමීමේ කටයුත්තට පැමිණි ඇතැම් නිලධාරීන් නියෝජනය කරන්නේ 'සභාව' නමින් හැඳින්වූ ස්ථානයකි. අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් සොයා ගෙන තිබෙන සෙල්ලිපියක සඳහන් වන පරිදි *කෙරෙළෑගම* නම් ඉඩම මහින්දාරාම නම් මෙහෙණි ආරාමයට පිරිනැමීමට *මැණින්ගමුවේ උදය* සහ *නිකවැල්ලේ සේන* නම් වූ නිලධාරීන් සභාව නියෝජනය කිරීමට එහි පැමිණ තිබේ. ඒ බව එම සෙල්ලිපියේ දක්වා තිබෙන්නේ

*''සභායෙන් ආ මැණින්ගමු උදහි ඉසා නිකවැලි සෙනු ඉසා''* යනුවෙනි.



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*



මෙහි සභාව යන පදයෙන් අදහස් කර තිබෙන්නේ එවක පැවති අධිකරණය යි. රජය සතු ඉඩම් වෙනත් අයෙකුට පැවරීම නීතිමය කටයුත්තකි. එහෙයින් එහි දී අධිකරණය නියෝජනය කරන නිලධාරීන්ගේ සහභාගිත්වය අවශ්‍ය කටයුත්තකි. එවැනි අවස්ථාවල දී එම නිලධාරීන්ගේ රාජකාරිය වන්නට ඇත්තේ පිරිනමනු ලබන ඉඩමේ සීමා සහ ඉඩම භුක්ති විඳීමට අදාළ කොන්දේසි ලේඛනගත කිරීම විය යුතු ය.

සභාව යන වචනය නොයෙදෙන තැන් කිහිපයක 'මහලේ' යන පදය දක්නට තිබේ. එය මහාලේඛක යන පදය පැරණි සිංහල භාෂාවෙන් ලියන ලද ආකාරය යි. එය මහලේකම් යන වචනයේ තේරුමට සමාන ය. රජයේ ලේකම්වරුන්ගේ රාජකාරිය සියලු රජයේ කටයුතු ලේඛනගත කිරීම සහ එම ලේඛන ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කරන කටයුතු සම්පාදනය කිරීම ය. මෙවැනි මහලේකම්වරයෙකු ගැන මැදිරිගිරියෙන් සොයා ගෙන තිබෙන සෙල්ලිපියක සඳහන් ය. ඒ කාලයේ මැදිරිගිරියේ පිහිටා තිබූ ඇත්වෙහෙර නමින් හැඳින්වූ පධානඝරයකට දෙවන සේන රජතුමාගේ අණින් පිරිනමන ලද ඉඩම් පූජා කර එහි නීතිමය කටයුතු ඉටු කිරීමට කාශ්‍යප නමැති මහලේකම්වරයා *(මහලේ කස්බා)* එහි පැමිණි බව එම සෙල්ලිපියේ සඳහන් ය.

අනුරාධපුරය අගනගරය ලෙස පැවති යුගයේ දී රටේ පාලන කේන්ද්‍රස්ථානය වූයේ ද එය යි. රජු අගනගරයේ සිට රට පාලනය කළේ ය. වර්තමාන කාලයේ මෙන් සන්නිවේදනය සහ ගමනාගමනය පහසු නොවූ ඒ කාලයේ අනුරාධපුරයෙන් ඈත පළාත්වල පාලන කටයුතු අනුරාධපුරයේ සිට මෙහෙයවීම අපහසු කරුණක් බව පැහැදිලි ය. මේ හේතුව නිසා පළාත් පාලනය සඳහා රජයට සම්බන්ධ වෙන ම පරිපාලන ඒකක තිබූ බව පැහැදිලි කර ගැනීමට ඉවහල් වන සාධක සාහිත්‍ය මූලාශ්‍රයවල දක්නට තිබේ. මේ සඳහා පෙන්වා දිය හැකි නිදසුනක් වන්නේ වසභ රජතුමාගේ පාලන කාලයේ දී රචනා කරන ලද වල්ලිපුරම් රන්පත් ලේඛනය යි. එම ලේඛනයේ සඳහන් කර තිබෙන්නේ වසභ රජතුමාගේ පාලන සමයේ නාගදීපය පාලනය කළ ඎෂිගිරි නම්

*ඡායාරූපය අංක 4.1 ක්‍රිස්තු වර්ෂයෙන් 9 වන සියවසේ දී රචනා කරන ලද සෙල්ලිපියක දැක්වෙන සංකේත කිහිපයක්. මෙහි වටාපතක සලකුණ මඟින් රාජකීයත්වය හඟවන සෙංකෝලය ද වැලක් මෙන් සලකුණ මඟින් හංසයා ද නිරූපිත ය. හංසයා සලකුණු කරන්නේ දෙන ලද දීමනාවේ පවිත්‍රත්වයයි. ඉහළින් ම ඇති අඩසඳ ලකුණෙන් මෙම දීමනාව ඉර හඳ පවත්නාතාක් කල් පවතින බවද බල්ලා හා කපුටා සංකේතය මඟින් මෙම දීමනාවට බාධා කළවුන් මතු ආත්මයේ එවැනි සතුන්ව ඉපැදෙන බවත් හඟවයි.*

ඇමතියා එහි පියංගුකතිස්ස නම් විහාරය ඉදි කළ බව යි. මෙම සඳහන මගින් පැහැදිලිව පෙන්වා දෙන්නේ ප්‍රත්‍යන්ත ප්‍රදේශ පාලනය කිරීමට මධ්‍යම රජයේ නියෝජිතයින් පත් කොට තිබූ ආකාරය යි.

මීට අමතරව ඊටත් වඩා පහළ මට්ටමේ පරිපාලන කටයුතු මෙහෙයවීමට ස්වාධීන මණ්ඩල ඒ ඒ ප්‍රදේශවල තිබිණි. ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවසේ පැවති එවැනි ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන මණ්ඩල සෙල්ලිපිවල හඳුන්වා දී තිබෙන්නේ 'දසගම් ඇත්තන්' යනුවෙනි. ගම් දහයක් නියෝජනය වන පරිදි ඒවායේ ප්‍රධානීන්ගෙන් සමන්විත එම මණ්ඩලය සුළු පරිමාණයේ පරිපාලන කටයුතුවල සහභාගි වී තිබේ. මාතලේ දිස්ත්‍රික්කයට අයත් පැරණි බෞද්ධ විහාරයක් වූ කළුදියපොකුණේ තිබෙන සෙල්ලිපියක එම විහාරයට දානය පූජා කිරීමේ දී යම් ගැටලුකාරී තත්ත්වයක් පැන නැගුණ හොත් දසගම් ඇත්තන් රැස් වී එය විසඳා දිය යුතු බව සඳහන් කර තිබේ.

අනුරාධපුරය මෙරට පාලන කේන්ද්‍රය ලෙස ක්‍රියාත්මකව පැවති සමයේ සිට රාජ්‍ය උරුමය සම්බන්ධයෙන් අනුගමනය කරන ලද්දේ පිතෘ මූලික ක්‍රමයකි. අභිෂේක බිසවගේ පුතුන්ට රාජ්‍යයට උරුමකම් කීමේ හැකියාව තිබිණි. පියාගෙන් පසුව පුතුට රාජ්‍යය හිමිවිය යුතු බවට පිළිගැනීමක් පැවතිය ද නියමානුකූල වශයෙන් ක්‍රියාත්මක වූයේ ඒ ඒ අවස්ථාවල රජ පවුලේ සිටි ජ්‍යේෂ්ඨ පුද්ගලයාට රාජ්‍ය බලය ලැබීම යි. දේවානම්පියතිස්ස රජුගෙන් පසු පිළිවෙළින් බලයට පත් වුයේ උත්තිය, මහාසිව, සූරතිස්ස සහ අසේල යන ඔහුගේ බාල සොහොයුරන් සිවුදෙනා යි.

පරිපාලනයේ දී රටේ ජනතාවගේ සුභසිද්ධිය පතා කටයුතු කිරීමට පාලකයෝ කටයුතු කළහ. ආගමික ස්ථානවලට දීමනා පිරිනැමීම පමණක් නොව සාමාන්‍ය ජනතාවගේ යහපත වෙනුවෙන් ද ඔවුහු ක්‍රියා කළහ. විශේෂයෙන් ම ජනතාවට අත්‍යවශ්‍ය කාරණයක් වන පොදු සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීමට පාලකයෝ නිබඳව සිය අවධානය යොමු කළහ. 'වෙජ්ජසාලා' යන පදය පැරණි සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් ය. එයින් අදහස් කරන ලද්දේ රෝහල් ය. 'වෙජ' යනුවෙන් හඳුන්වන ලද වෛද්‍යවරු ගැන ක්‍රිස්තු පූර්ව දෙවන සියවස තරම් ඈත කාලයකට අයත් සෙල්ලිපිවල සඳහන් වේ. බුද්ධදාස රජතුමා (ක්‍රි.ව 340368) රෝහල් ඉදි කිරීමට මහත් වෙහෙසක් දැරූ පාලකයෙකි. පස්වන මහින්ද රජතුමා (ක්‍රි.ව. 9821029) එවක ශ්‍රී ලංකාවේ නොයෙක් පළාත්වල පිහිටුවා තිබූ රෝහල්වලට අවශ්‍ය සියලු දේ ලබා දීමට කටයුතු කළේ ය. හතරවන කාශ්‍යප රජතුමාගේ (ක්‍රි.ව. 914923) පාලන කාලයේ දී අනුරාධපුර සහ එහි අවට ප්‍රදේශවල දරුණු උණ රෝගයක් පැතිර ගියේ ය. එවක පැවති සාමාන්‍ය රෝහල්වල තිබෙන පහසුකම් යටතේ එම උණ රෝගය වැළඳුණු රෝගීන්ට ප්‍රතිකාර කිරීම අපහසු බව වටහා ගත් රජතුමා ඒ සඳහා විශේෂ රෝහලක් ඉදි කළ බවත් ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් ය. ඒ සඳහා '*උපසග්ගරෝගනාස*' යන යෙදුම මූලාශ්‍රයවල දැක්වේ.

ගැබිනි මව්වරුන්ගේ අවශ්‍යතා සඳහා මාතෘ නිවාස ඉදි කිරීමට පළමුවන උපතිස්ස රජතුමා (ක්‍රි.ව. 365406) ක්‍රියා කළේ ය. එවැනි ශාලා හඳුන්වා දී තිබෙන්නේ 'පසවන්තිනාම සාලා' යන නමිනි. ප්‍රසූතිය සඳහා ඉදි කළ ශාලා යනු එහි අදහස යි. සෙල්ලිපිවල එවැනි ගොඩනැගිලි තිඹිරිගේ යනුවෙන් නම් කොට තිබේ. ඉතා පැරණි කාලයක සිට මෙරට මාතෘ නිවාස ඉදි කිරීමේ සම්ප්‍රදාය පැවතිණි. පණ්ඩුකාභය රජුගේ කාලයේ අනුරාධපුරයේ සොත්ථිසාලා නමින් හඳුන්වන ලද ගොඩනැගිලි විශේෂයක් තිබිණි. සොත්ථිසාලා යන නම බ්‍රාහ්මණයින් සිය ආගමික කටයුතු පවත්වන ලද තැන් හැඳින්වීමටත් මාතෘ නිවාස හැඳින්වීමටත් භාවිත කළ බව අටුවා ග්‍රන්ථවල විස්තර කර තිබේ.

අපේ රට පාලනය කළ බුද්ධිමත් රජවරු තමන්ගේ අසල්වැසි රටවල් සමග මෙන් ම ඇතැම් අවස්ථාවල දුරු රටවල් සමග ද ඉතා සුහදශීලී සබඳතාවකින් කටයුතු කළහ. කාලයෙන් කාලයට එම සබඳතා ක්‍රියාත්මක වූ ප්‍රදේශ වෙනස් වූ අතර ඉන්දියාව ඇතුළු වෙනත් ආසියාතික රටවල් සහ අරාබිය සමග ඉතිහාසයේ ඈත කාලයක සිට ද සමහර යුරෝපා රාජ්‍ය සමග මෑත සියවස්වල ද සබඳතා පැවතිණි. ලම්බකර්ණ වංශයට අයත් ශ්‍රී ලංකාවේ කීර්තිමත් පාලකයෙකු වූ පළමුවන ගජබාහු රජතුමා (ක්‍රි.ව. 114136) පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගි වීම සඳහා දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයට පැමිණි බව එරටේ සෙල්ලිපිවල සඳහන් ය.

සමහර විට මෙම රාජ්‍ය චාරිකාවේ අරමුණ වන්නට ඇත්තේ දෙරට අතර රාජ්‍ය තාන්ත්‍රික සුහදතාව නංවාලීම විය හැකි ය.

කනිට්ඨතිස්ස රජතුමා (ක්‍රි.ව. 167186) විසින්

රෝමානුක දේශයට තානාපති නිලධාරීන් යවන ලද බවට සඳහනක් මහාවංසයට ඇතුළත් ය. මෙහි රෝමානුක දේශය යනුවෙන් හඳුන්වා තිබෙන්නේ රෝමය යි. රුවන්වැලි සෑයට පූජාවක් පැවැත්වීමට අවශ්‍ය වූ වීදුරු පබළු රැගෙන ඒම එම දූත මෙහෙවරේ අරමුණ විය.

ක්‍රිස්තු වර්ෂයෙන් අටවන හා නමවන සියවස්වල දී මෙරට පාලකයින් චීනය සමග සමීප සබඳතාවක් ගොඩ නගා ගත්හ. ඒ කාලය තුළ චීනයට මෙරටින් තානාපතිවරු පිටත්ව ගියෝය. හයවන අග්ගබෝධි රජුගේ පාලන කාලයේ දී මෙම සබඳතා වඩාත් ශක්තිමත් වී තිබිණි. එසමයේ දී විසි වතාවක් ශ්‍රී ලංකාවෙන් චීනයට රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන් යෙදිණි. වෙළෙඳාමේ සාර්ථකත්වය චීනය සමඟ ගොඩ නගා ගත් සබඳතාවල මූලික පසුබිම වූ අතර ඉන් සංස්කෘතික බලපෑමක් ද ඇති කළේය.

ශ්‍රී ලංකාව සිය අසල්වාසී රටවල් සමඟ පැවැත්වූ සබඳතා පිළිබිඹු වන තවත් ආකාරයක් ඒ රටවල් සමග ඇති කර ගත් විවාහ සබඳතා මගින් පිළිබිඹු වෙයි. විශේෂයෙන් ම ඉන්දියාවේ ප්‍රබල රාජ්‍ය ලෙස පැවති කාලිංග සහ පාණ්ඩ්‍ය දේශ සමග මෙරට පාලකයින් ඇති කර ගත් විවාහ සබඳතා ගැන තොරතුරු වංසකථාවල දක්නට තිබේ. පළමුවන විජයබාහු රජතුමා (ක්‍රි.ව 1070 1110) තිලෝකසුන්දරී නම් වූ කාලිංග වංශික කුමාරිකාව විවාහ කර ගත් අතර එරජුගේ සොහොයුරිය වූ මිත්තා කුමරිය විවාහ වූයේ පාණ්ඩ්‍ය දේශයේ කුමරෙකු සමග ය. ඥාති සබඳතා හරහා දේශපාලන බලය ස්ථාවරව පවත්වා ගෙන යාම මෙවැනි විවාහ සම්බන්ධතාවල මූලික අරමුණ වූ බව පෙනේ.

භාෂාආගම් අතින් වෙනස් වුව ද තමන්ගේ අසල්වාසී රටවල ප්‍රජාව දෙස විශ්වාසවන්ත ලෙස කටයුතු කිරීම අපේ පැරණි පාලකයින්ගේ විදේශ ප්‍රතිපත්තිය තුළ තිබූ කැපී පෙනෙන ලක්ෂණයකි. පළමුවන විජයබාහු රජතුමා විසින් පොලොන්නරුවේ පිහිටි දළදා මාලිග යේ ආරක්ෂාව සඳහා වේලෙක්කාර හමුදාව පත් කිරීම එයට කදිම නිදසුනකි. වේලෙක්කාර හමුදාව යනු දකුණු ඉන්දියාවෙන් මෙහි පැමිණි වැටුපට සේවය කරන ආරක්ෂක සේනාවකි.

ක්‍රිස්තු වර්ෂයෙන් දහවන සියවසින් පසු කාලයේ දී අපේ රජවරු අරාබි රටවල් සමඟ ඉතා සුහද සබඳතාවක් ගොඩ නගා ගත්හ. අරාබි වෙළෙඳුන්ගේ මූලිකත්වයෙන් එවක ඉන්දියානු සාගරයේ ක්‍රියාත්මකව පැවති වෙළෙඳ කටයුතුවලට ශ්‍රී ලංකාවේ දායකත්වය ස්ථාවර ලෙස පවත්වා ගෙන යාම එහි අරමුණ වූ බව පෙනේ. ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවසේ ජීවත් වූ අරාබි ජාතික ඉතිහාසඥයකු වූ අල්බලසූරි සඳහන් කරන අන්දමට එසමයේ රතුකැට දිවයිනේ (මේ නමින් හඳුන්වන ලද්දේ ශ්‍රී ලංකාව යි) රජු ඉස්ලාමීය රජු සමග තෑගි හුවමාරු කර ගත්තේය.

සාරාංශ වශයෙන් දැක්වුව හොත් පුරාණ කාලයේ මෙරට පැවති පාලනයේ මූලික අරමුණ වූයේ රටවැසියා අතර සාමකාමී සහජීවනයක් ඇති කිරීමත් ඔවුන්ගේ සුභසාධනය සැලසීමත් මව්බිමේ සුරක්ෂිතතාව සහ රටවැසියාගේ අනාගත චිරජීවනය උදෙසා භූමියේ අඛණ්ඩත්වය ආරක්ෂා කිරීමත් ය. ඊට සමාන්තරව තමන්ගේ අසල්වාසී රටවල් සමග සුහදව අවබෝධයෙන් කටයුතු කිරීමට ද ඔව්හු දුරදක්නා ඥානයකින් යුතුව ක්‍රියා කළ බව ද පෙනේ.

## 4.2 ආර්ථිකය

රටේ බොහෝ පිරිසක් ජීවත් වූයේ ගම්වල ය. ඒ ගම්වල වැසියන්ගේ ජීවිත වර්තමානයට සාපේක්ෂව ඉතා සරල ආකාරයට හැඩ ගැසී තිබිණි. බොහෝ දෙනාගේ ජීවන වෘත්තිය වූයේ ගොවිතැන යි. ඇතැමුන් හේන් ගොවිතැන්වල යෙදුණ අතර සෙසු අය කුඹුරු ගොවිතැන්වල නිරත වූහ. ජීවත් වීම සඳහා සතුන් ඇති කිරීම පැවතිණි. ඊට අමතරව නොයෙක් වෘත්තීන්වල යෙදුණු පිරිස් ඔවුන්ට ම වෙන් වූ ගම්වල ජීවත් වූහ.

### 4.2.1 ගොවිතැන

ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ වාසය කළ බොහෝ ගැමියන්ගේ ප්‍රධාන ජීවන වෘත්තිය වූයේ ගොවිතැන යි. සතුන් ඇති කිරීම හෙවත් පශු පාලනය ද ගොවිතැන් කටයුතුවලට ම තදානුබද්ධව පවත්වා ගෙන ගිය කටයුත්තකි. ගොවිතැන් කටයුතු ආකාර දෙකකට සිදු කෙරිණි. ඉන් පළමුවැන්න හේන් ගොවිතැන යි. දෙවැන්න මඩ ගොවිතැන හෙවත් කුඹුරු ගොවිතැනයි. මේ අතරින් වඩාත් පැරණි හේන් ගොවිතැන බව ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් තහවුරු කරයි. බුත්සරණ නම් සාහිත්‍ය කෘතියේ සෙහෙන් යනුවෙන් ද සිංහල උම්මග්ග ජාතකයේ සේන් යනුවෙන් ද සෙල්ලිපිවල 'පිටිබිම්' යනුවෙන් ද හඳුන්වා දී තිබෙන්නේ පැරණි කාලයේ තිබූ හේන් ය.



*ඡායාරූපය අංක 4.2 සකස් කර බෝග සිටුවීමට පෙර නවදැලි හේනක දර්ශනයක්*

**හේන් ගොවිතැන** හේන් ගොවිතැන යනු ගොඩ ගොවිතැනකි. තමන්ට අවශ්‍ය ප්‍රමාණයේ ධාන්‍ය සහ එළවළු වවා ගැනීමට ප්‍රමාණවත් තරමේ ඉඩම් කොටසක් මහකැලෑවකින් වෙන් කොට ගෙන එය කපා ගිනි තැබීමෙන් හේනක් සකස් කර ගනු ලැබේ. මෙහි දී විශාල ගස් කපා නොදැමීමට වග බලා ගැනේ. මූලික වශයෙන් එළිපෙහෙලි කර ගත් කැලෑ කොටස ගිනිතැබීමට පෙර සියලු සතුන්ට ඉන් ඉවත් වන ලෙස ශබ්ද නගා කෑ ගැසීම සිදු කරන්නේ හේන අයත් ගොවියා විසිනි.

අලුතින් ගිනිතබා ගත් හේනක් හඳුන්වන්නේ නවදැලි හේන නමිනි. එවැනි හේන් ඉතා සරුසාර ය. නවදැලිසේන යන යෙදුම සද්ධර්මරත්නාවලියේ ද යෙදී තිබේ. ශ්‍රී ලංකාවේ ඇතැම් පළාත්වල නවදැලි හේන යන යෙදුමට වෙනත් තේරුමක් දී තිබේ. කුරක්කන්, කොල්ලු, උඳු, මුං, ඉරිඟු, මෑ, තණහාල්, අසමෝදගම්, අමු යන පැළෑටි නවය දලු ලා සරුවට වැවුණු හේන් නවදැලි හේන් යනුවෙන් හැඳින්වෙන බව ඉන් කියැවේ. කාලයක් අතහැර දමා යළිත් වගා කිරීම අරඹන හේන් හැඳින්වීමට 'කනත්ත' යන වචනය භාවිත කරන්නේ අනුරාධපුර පළාතේ ගැමියන් ය. හේන් වගාවේ දී අනුගමනය කෙරෙන සාමාන්‍ය ක්‍රමය වූයේ වරක් දෙවරක් වගා කළ හේන ඉන් පසු අතහැර දැමීම යි. කාලයක් එසේ අතහැර දමා තිබීමෙන් එතැන යළිත් කැලෑව හට ගනී. එනිසා පැරණි හේන් වගාව කිසිවිටෙකත් පරිසරයට අනිසි බලපෑමක් ඇති නොකළේ ය.

හේන්වල වගා කරන ලද දේ අතර උඳු, මෑ, මුං, කුරක්කන්, ඉරිඟු, තල, අමු, අබ, දුරු, තණහාල් යන ඇට වර්ග ද කරබටු, තිබ්බටු, වම්බටු, අළුපුහුල් සහ වට්ටක්කා යන එළවළු වර්ග ඇල් වී වර්ග සහ අල වර්ග උක්ගස් සහ කපු ද විය. වගා කරන ලද්දේ ඒවාට ම වෙන් වූ හේන්වල ය. ඒ කාලයේ රටට අවශ්‍ය වූ රෙදි සහ හකුරු නිපදවීමට ප්‍රමාණවත් තරමින් කපු වගාව සහ උක් වගාව මෙරට දියුණු වී තිබිණි. වැටුප් ලබමින් උක් කර්මාන්තයේ යෙදී සිටි කම්කරුවන් ගැන වංසකථාවල සඳහන්ව තිබේ. ඉතිහාසයේ දීර්ඝකාලයක් තිස්සේ රටට අවශ්‍ය හකුරු රට තුළම නිපදවා ගැනීමට අපේ මුතුන්මිත්තෝ සමත් වූහ. ක්‍රිස්තු වර්ෂයෙන් දහසයවන සියවස වන තුරු මෙරටට සීනි ආනයනය නොකළ බව විද්වත්හු පෙන්වා දෙති.

හේනක් කොටන්නේ තමන් වාසය කරන නිවසට තරමක් ඈත ප්‍රදේශයක බැවින් හේනේ අස්වැන්න ලබා ගන්නා තුරු ගොවියෝ හේනේ ඉදි කරන



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*



*සිතුවම අංක 4..1 හේනක් යනු ඉතා සුන්දර දර්ශනයකි. හේන වන සතුන්ගෙන් බේරා ගැනීමට රාත්‍රි කාලයේ ලැගුම් ගැනීමට සකස් කළ පැල, හේන වටා ඉදි කළ දඬුවැට ආදී දේ එහි දක්නට තිබෙන සුලබ දේ ය.*

ලද පැල්පතක තාවකාලිකව ලැගුම් ගනිති. හේන වනසතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට හේන වටා ඉදි කරන ලී වැට හඳුන්වන්නේ 'දඬුවැට' යන නමිනි. හේනේ උස් ගසක ඉදි කරන කුඩා පැල්පත හැඳින්වෙන්නේ 'පැල' නමිනි. රාත්‍රි කාලයට හේනට පැමිණෙන සතුන්ගෙන් තම හේන ආරක්ෂා කර ගැනීමට ගොවියා රැය පහන් කරන ලද්දේ මෙම පැලේ ය.

හේන් වගා කිරීම වෙනුවෙන් ඇතැම් රජවරුන්ගේ කාලවල දී බදු අය කර ගෙන තිබේ. කැති අඩ, කෙටූ කනබ අය යනුවෙන් සෙල්ලිපිවල හඳුන්වා දී තිබෙන්නේ එවැනි බදු වර්ග දෙකකි. පොළොන්නරුවේ රජ කළ නිශ්ශංක මල්ල රජතුමා (ක්‍රි.ව 1187 1196) එම බදු වර්ග දෙක අහෝසි කළ බව එරජු විසින් කරවන ලද සෙල්ලිපිවල සඳහන් වේ.

පුරාණ කාලයේ ජනගහනය අධික නොවූයෙන් හේන් වගාව සිය ජීවන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් වෘත්තියක් විය. මඩ ගොවිතැනක් ලෙස වී වගාව ආරම්භ වූයේ වැඩිවන ජනගහනයට අවශ්‍ය කරන ආහාර වැඩිවැඩියෙන් නිපදවීමට ය.

**වී ගොවිතැන** සෙල්ලිපිවල, වී වගා කරන ලද තැන් කුඹුර සහ කෙත යන වචන දෙකෙන් හඳුන්වා දී තිබේ. ඇතැම් විට කුඹුර යනුවෙන් හඳුන්වන්නට ඇත්තේ වී වගාවට භාවිත කළ කුඩා ඉඩ ප්‍රමාණයක් වීමට ඉඩ තිබේ. 'කෙත' යන වචනය සංස්කෘත භාෂාවේ 'ක්ෂෙත්‍ර' යන වචනයෙන් සකස් වූවකි. ඉන් අදහස් කරන ලද්දේ තරමක විශාල කුඹුරු යායවල් ය.

බොහෝ අවස්ථාවල වී වගාව පවත්වා ගෙන යන ලද්දේ වාරිමාර්ග භාවිත කිරීමෙනි. මෝසම් වැසි කාලවල දී වර්ෂා ජලය වැව්වල රැස් කර ගැනිණි. අනතුරුව ඒවා ඇළ මාර්ග ඔස්සේ කුඹුරුවලට ලබා දීමට කටයුතු යොදා තිබිණි. වර්ෂයට දෙවරක් වී වගා කෙරිණි. වී වගා කළ කාල හඳුන්වන්නේ 'කන්න' යන නමිනි. වගා කළ කන්න දෙක හඳුන්වන ලද්දේ මහ කන්නය සහ යල කන්නය යනුවෙනි. මීට අමතරව මැද කන්නය යනුවෙන් හැඳින්වෙන තවත් කන්නයක් ගැන සෙල්ලිපිවල සඳහන් ය. යලමහ අතර තිබූ එම කන්නයේ වගා කිරීම රඳා පැවතියේ ජලය සුලබ වීම මත ය.

වී වගාව සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා වියළි කලාපයේ ප්‍රධාන අවශ්‍යතාව වූයේ ප්‍රමාණවත් ලෙස ජලය ලබා ගැනීම යි. වර්ෂා ජලය එකතු කර ගැනීමත් ස්වභාවික ගංගා හරස් කර ඇළමාර්ග ඔස්සේ ජලය කුඹුරු වෙත ගෙන යාමත් එම අවශ්‍යතාව සපුරා ගැනීමට අනුගමනය කළ උපක්‍රම දෙකයි. වැව් තැනීමේ සම්ප්‍රදාය මෙරට දියුණු වූයේ ජලය රැස් කර ගැනීමේ අවශ්‍යතාවට මුහුණ දීමේ උපක්‍රමයක් ලෙසය. මහා පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව 11531186) විසින් ප්‍රකාශ කරන ලද "අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතුය" යන ප්‍රකාශය මගින් ජලය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පාලකයා විසින් දුටු ආකාරය අපට පෙන්වා දෙයි.

වර්තමානයේ දී මෙන් නොව පැරණි යුගයේ කුඹුරු ගොවිතැන් කිරීමේ දී නොයෙකුත් චාරිත්‍ර සිදු කිරීමට ගොවියෝ වග බලා ගත්හ. ස්වභාවධර්මය සමඟ ඉතා සුහදශීලි ලෙස කටයුතු කරමින් තමන්ගේ ජීවිකාව කර ගැනීමට ඉන් ලැබුණු පිටිවහල අතිමහත් ය.

**සත්ත්ව පාලනය** ගොවිතැන් කටයුතුවලට අමතරව එකල සත්ත්ව පාලනය ද පැවතිණි. ඒ අතර ප්‍රධාන වූයේ ගව පාලනය යි. ගවපාලනයේ යෙදුණු පිරිස් සඳහා ම වෙන් වූ ගෝපාලගම් ගැන සෙල්ලිපිවලත් අන් සාහිත්‍ය මූලාශ්‍රයවලත් සඳහන් ය. පශු සම්පත් හෙවත් සතුන්ගෙන් ලබා ගන්නා ද ආහාර සඳහා මහත් සේ ඉවහල් විය. මී කිරි, ගිතෙල්, වෙඬරු ආදී දේ ඒ අතර ප්‍රධාන විය. කොළඹ ජාතික කෞතුකාගාරයේ තිබෙන හතරවන කාශ්‍ය රජතුමා විසින් කොටවන ලද සෙල්ලිපියක කිරිගෙරි යන පදය දකින්නට තිබේ. ඉන් අදහස් කර තිබෙන්නේ කිරි ලබා ගැනීම සඳහා ඇති කරන ගවයින් ය. ගෘහණියක් එළදෙනකගෙන් කිරි දෝවනය කරන ආකාරය පෙන්වන කදිම කැටයමක් සීගිරියේ පිහිටි නාගපබ්බ විහාරය නමින් හැඳින්වෙන පුරාණ ස්තූපයේ ධාතුගර්භයේ තැන්පත් කර තිබූ මහාමේරු ගලේ කැටයම් කර ඇත.

ගවයින් හැරුණු විට කුකුළන් සහ එළුවන් ද නිවෙස්වල ඇති කළේ ය. පොළොන්නරුවේ මැදිරිගිරියේ පිහිටා තිබුණු ඇත්වෙහෙර පධානඝරයේ රෝහලේ රෝගීන්ගේ අවශ්‍යතා සඳහා ස්වභාවිකව මියගිය එළුවන්ගේ සහ කුකුළන්ගේ මාංශ පමණක් යොදා ගත යුතු බව දැක්වෙන සඳහනක් ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවසේ රචනා කරන ලද සෙල්ලිපියක දක්නට තිබේ.

### 4.2.2 කර්මාන්ත

ඉතා පුරාණ කාලයක සිට ශ්‍රී ලංකාවේ ලෝහ කර්මාන්තය ඉතා දියුණු තත්ත්වයක පැවති බව මීට ඉහත පාඩම්වල දී ඉගෙන ගැනීමට ඔබට අවස්ථාවක් ලැබිණි. ලෝහ භාවිත කරමින් කර්මාන්තවල යෙදුණු ශිල්පීන් ගැන යම් තොරතුරු මූලාශ්‍රයවල දක්නට තිබේ. මේ අතර විශේෂයෙන් කැපී පෙනෙන්නේ යකඩ වැඩ කළ කම්මල්කරුවන් ය. ඔවුන් හැඳින්වීමට සෙල්ලිපිවල යොදා තිබෙන්නේ 'කබර' යන නම යි. ඒ කම්මාර යන වචනය පුරාණ සිංහල භාෂාවෙන් ලියූ ආකාරය යි. යකඩ තැළූ කම්මල්කරුවා ගම්වැසියන්ට ඉතා අවශ්‍ය වැදගත් පුද්ගලයෙකු විය. එදිනෙදා ගොවිතැන් කටයුතුවලට අවශ්‍ය කැත්ත, උදල්ල, නගුල ආදි ද ඔවුන්ට තනා දුන්නේ කම්මල්කරුවා යි. පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් මුතුගල්ල නම් ස්ථානයේ තිබෙන සෙල්ලිපියක මජ්ජිම නම් කම්මල්කරුවකු ගැන සඳහන්ව තිබේ.

මීට අමතරව තඹ ලෝහයෙන් (තබකර) සහ ටින් ලෝහයෙන් කර්මාන්ත කළ ශිල්පීහු ද එකල සිටියහ. එකල විසූ රන්කරුවන් හැඳින්වීමට පැරණි ලේඛනවල යොදා තිබෙන්නේ තුලාධාර යන වචනය යි. ඇතැම් පොත්පත්වල ඔවුන් ස්වර්ණකාර යන නමින් ද විස්තර කර තිබේ. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් මණ්ඩගල නම් ස්ථානයේ පිහිටි එක්තරා සෙල්ලිපියක තුලදර සුමන නමින් හඳුන්වා දී තිබෙන්නේ රන්කරුවෙකු ගැන ය. අනුරාධපුර, මාගම ආදි පැරණි නගරවල කර තිබෙන පුරාවිද්‍යාත්මක කැණීම්වලින් සොයා ගෙන තිබෙන මැණික් සහ අර්ධ මැණික් වර්ගවලින් නිම කරන ලද පබළු, මුද්‍රා ආදි දේ මගින් එකල මෙරට සමාජයේ පැවති මැණික් කර්මාන්තයේ ස්වභාවය පිළිබිඹු කරයි. එවැනි කටයුතුවල නියුක්තව සිටි ශිල්පීන් හඳුන්වන ලද්දේ මණිකර යන නමිනි.

පුරාණ කාලයේ මෙරට සමාජයේ පැවති තවත් කර්මාන්තයක් වූයේ ඇත්දත් කැටයම් කලාව යි. මහනුවර දිස්ත්‍රික්කයට අයත් වේගිරිය දේවාලය අසල පිහිටි සෙල්ලිපියක දටික සුමන නම් වූ ඇත්දත් ශිල්පියකු ගැන සඳහන් ය. දටික යනු දන්තික යන වචනයෙන් සකස් වූවකි.

එකල විසූ සාමාන්‍ය ජනතාවට තමන්ගේ එදිනෙදා කටයුතු සඳහා වඩාත් උපයෝගී වූයේ මැටිභාණ්ඩ යි. පුරාවිද්‍යාත්මක කැණීම්වලින් අතිවිශාල ප්‍රමාණයක් එවැනි මැටිභාණ්ඩවලට අයත්

සුන්බුන් සොයා ගෙන තිබේ. මැටිභාණ්ඩ සෑදීම එකල හොඳින් සංවිධානය වූ කර්මාන්තයක්ව පැවතිණි. මැටිකර්මාන්තයේ නියැළි සිටි පුද්ගලයින් ගැන මීට අවුරුදු 2250 කට ඉහත ලියැවුණු සෙල්ලිපිවල පවා සඳහන් ය. එකල ඔවුන් හැඳින්වූයේ කුම්භකාර (කුබකර) යන නමිනි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ වෙහෙරකෙම නම් ස්ථානයේ තිබෙන සෙල්ලිපියක 'තතවය' නමින් වචනයක් යෙදී තිබේ. මෙම වචනය තන්තු වාය යන දෙපදය මගින් සකස් වූවකි. එහි තේරුම නූල් කටින්නා යන්න යි. නූල් කැටීම රෙදි වියීමට අදාළ කටයුත්තකි. ඉතා පැරණි කාලයක සිට රෙදි වියීම අපේ රටේ පැවති බව ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් වේ. වෙහෙරකෙම සෙල්ලිපියේ සඳහන් වන නූල්කටින්නන් පිළිබඳ සඳහන් කිරීම ඒ කාලයේ පැවති රෙදි වියීමේ කර්මාන්තය පිළිබඳ නිසැක සාක්ෂියක් ලෙස සැලකිය හැකි ය.

වෘත්තිය වශයෙන් විවිධ කර්මාන්තවල නියැළුණු පුද්ගලයින් ගැන තොරතුරු අපේ ඉතිහාසයේ සඳහන් වීමෙන් පෙනෙන්නේ අපේ රටේ පැවති පුරාණ සමාජය ඉතා ක්‍රමවත් අන්දමට සංවිධානය වී තිබුණු බව යි. මේ සියලු ශිල්පීහු ඒ කාලයේ සමාජය හොඳින් පවත්වා ගෙන යාමට තමන්ගේ දැනුමෙන් සහ ශ්‍රමයෙන් ඉතා අගනා මෙහෙයක් ඉටු කරනු ලැබූහ.


**4.2.3 වෙළෙඳාම** පුරාණ කාලයේ පැවතියේ නගර කිහිපයකි. ඓතිහාසික මූලාශ්‍රයවල දක්වෙන අන්දමට අනුරාධපුරය සහ මාගම ඒ අතර ප්‍රධාන විය. ඒවා හැඳින්වීමට "පුර" යන පදය යොදා තිබේ. එවැනි විශාල නගරවල ජීවත් වූයේ වත්පොහොසත්කම් ඇති අය යි. ඒ නගරවල දේශීය මෙන් ම විදේශීය වෙළෙන්දන් ගැවසිණි. අනුරාධපුර නගරයේ දකුණු දොරටුව අසල කාළසුමන නමින් හැඳින් වූ වෙළෙඳපළක් තිබිණි.

වෙළෙඳාම පැරණි කාලයේ මෙරට පැවති ප්‍රධාන ජීවනමාර්ගයක් විය. වෙළෙඳ කටයුතු රට ඇතුළත මෙන්ම රටින් පිටත වෙනත් දේශ සමඟ ද පැවතිණි. සිගිරියේ බටහිර ජලඋද්‍යානයේ තිබෙන එක්තරා සෙල්ලිපියක 'අබල වපර' නමින් හැඳින්වෙන පුද්ගලයෙකු ගැන සඳහන් ය. ඒ ආම්ල ව්‍යාපාර යන වචනය පැරණි සිංහල භාෂාවෙන් ලියා ඇති ආකාරය යි. එලෙස හඳුන්වා දී තිබෙන්නේ සියඹලා වෙළෙන්දෙකි. එම සෙල්ලිපිය මීට අවුරුදු 2250 කට පමණ ඉහත කාලයක රචනා කරන ලද්දකි. සුළු පිරිසක් හැරුණු විට සෙසු වෙළෙන්දෝ සමූහ වශයෙන් සංවිධානය වී කටයුතු කළ හ. එවැනි සංවිධානයක් හඳුන්වන ලද්දේ 'පූගය' යන නමිනි. ඇතැම් තැනක ඒ සඳහා 'නියමස්ථාන' යන වචනය ද යොදා තිබේ.

වෙළෙඳාමේ නියුක්ත වූ පිරිස් එකල හඳුන්වන ලද්දේ 'වණිජ' යන නමින් හෝ 'වාපර' යන නමිනි. වාපර යන වචනය ව්‍යාපාරික යන පදය පැරණි සිංහල භාෂාවෙන් ලියූ ආකාරය යි. පැරණි සමාජයේ ජීවත් වූ ධනවත් පිරිසක් වූයේ මෙකී වෙළෙන්දන් ය. ඔවුන් විසින් බෞද්ධ භික්ෂූන්වහන්සේලාට වැඩ වාසය කිරීම සඳහා ගල්ගුහා පවා පූජා කර තිබේ. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් මණ්ඩගල නම් ස්ථානයේ තිබෙන සෙල්ලිපියක සුමන නම් වෙළෙන්දකු විසින් එලෙස පූජා කරන ලද ගල්ගුහාවක් ගැන සඳහන් වේ. වෙහෙරකෙම නම් ස්ථානයෙන් සොයා ගෙන තිබෙන සෙල්ලිපියකට අනුව රෙදි වියා වෙළෙඳාම් කළ අයගේ සංවිධානයක් මගින් භික්ෂූන්වහන්සේලාට ගුහාවක් පූජා කිරීමට අදාළ විස්තරය එම සෙල්ලිපියේ සඳහන් ය.

වෙළෙඳ නගර හා වෙළෙඳ ගම් ආශ්‍රිතව භාණ්ඩ වෙළෙඳාම් කිරීම සඳහා වෙළෙඳ පොළවල් පැවතිණි. මහාග්‍රාමයේ සිට අනුරාධපුරයට පැමිණි සුරනිමල නම් තැනැත්තෙකු වෙළෙඳපොළකින් සුවඳ විලවුන් මිල දී ගත් බව සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වේ. හතරවන උදය (ක්‍රි.ව.946 954) රජුගේ හෝපිටිගම ටැම් ලිපියේ සඳහන් තොරතුරු මගින් පුරාණ වෙළෙඳපොළවල් සංවිධානාත්මක ලෙස පාලනය වූ ආකාරය පෙන්වා දෙයි.

මේ සඳහා දක්විය හැකි හොඳම නිදසුන සොරබොරවැව ටැම් ලිපියේ විස්තර කර තිබෙන හෝපිටිගම වෙළඳපොළයි. එහි පාලනය සම්බන්ධයෙන් රජතුමා විසින් පැණ වූ නීති එම ලිපියට ඇතුළත් ය. වෙළඳපොළට පැමිණෙන කරත්තවලින් මිස වෙළඳපොළ පසුකොට ගෙන යන කරත්තවලින් බදු අය කර ගැනීම නොකළ යුතු බවට නීතියක් එහි සඳහන් වේ. හිරුඑළියෙන් ආවරණය වන පරිදි මඩුවක් යට පමණක් බුලත් වෙළඳාම් කළ යුතු බවට නීතියක් පනවා තිබෙන්නේ වියළි ගිය




*සිතියම 4.1 පැරණි වෙළෙඳ නගර සහ වරායයන්*

බූලත් මහජනයාට විකිණීම පාලනය කිරීමට ය. එකල පොහෝ දිනවල වෙළෙඳාම සිදු වුයේ නැත. පොහොය දිනවල වෙළෙඳාම් කළ අයගෙන් දඩ මුදල් අය කර ගත්තේ ය. හෝපිටිගම වෙළෙඳපළේ පොහොය දිනවල වෙළෙඳ කටයුතු කළ අය දඩයක් ලෙස මහියංගන විහාරයේ පහන් දැල්වීමට තෙල් ලබා දිය යුතු විය.

ක්‍රිස්තු වර්ෂයෙන් එකොළොස්වන සියවසේ සිට සහ තුන්වන සියවස දක්වා මෙරටේ ක්‍රියාත්මක වූ දකුණු ඉන්දියානු සම්භවයක් ඇති වෙළෙඳ සංවිධාන කිහිපයක් ගැන ශ්‍රී ලංකාවෙන් සොයා ගෙන තිබෙන ඒ කාලයට අයත් දෙමළ සෙල්ලිපිවල සඳහන්ව තිබේ. නානාදේසී, වලඤ්ඤියාර්, අයින්නුරුවර් යනු ඉන් කිහිපයකි. නානාදේසී වෙළෙඳ සංවිධානයට අයත් ලෝහ මුද්‍රාවක් හම්බන්තොටින් සොයා ගෙන තිබේ.

අනුරාධපුර යුගයේ මුල් කාලයේ මෙරට සැලකිය යුතු ප්‍රමාණයක් විදේශික වෙළෙඳුන් සිටි බවට සාක්ෂි තිබේ. දකුණු පළාතේ පිහිටි බෝවත්තේගල නම් ස්ථානයේ ඇති සෙල්ලිපියක 'කබොජ මහ පුගිය' යන යෙදුම දක්නට තිබේ. එහි සඳහන් වන්නේ කාම්බෝජවරුන්ගේ මහා වෙළෙඳ සංවිධානයක් ගැන යි. කාම්බෝජවරු යනු ඒ කාලයේ ඇෆ්ඝනිස්ථානය ප්‍රදේශයෙන් මෙහි පැමිණි වෙළෙඳ පිරිසකි.

අතීතයේ සිටම අන්තර්ජාතික වෙළෙඳ කටයුතුවල දී අපේ රට වැදගත් වැඩ කොටසක් ඉටු කළේය. ඊට බලපෑ එක් ප්‍රධාන හේතුවක් වූයේ ශ්‍රී ලංකාව ඉන්දීය සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීම යි. පෙර අපර දෙදිග වෙළෙඳාමේ හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස පැරණි කාලයේ දී ශ්‍රී ලංකාව ඉටු කළ කාර්ය භාරය සුළු කොට තැකිය නොහැකි ය.

අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වීමට තුඩු දුන් එක් නිශ්චිත ප්‍රධාන සාධකයක් වූයේ ද අන්තර්ජාතික වෙළෙඳාම යි. බටහිරින් මාතොට වරාය ද නැගෙනහිරින් ගෝකණ්ණතිත්ථ නමින් එකල හැඳින්වූ වර්තමාන ත්‍රිකුණාමලය වරාය ද පිහිටියේය. ඊට අමතරව බටහිර වෙරළේ මෙන් ම නැගෙනහිර වෙරළේ පිහිටි කුඩා වරායවල ක්‍රියාකාරීත්වය ද අනුරාධපුරයේ නාගරික නැගීමට සෘජු බලපෑමක් ඇති කළේය. උතුරු වෙරළේ පිහිටි ජම්බුකෝලපට්ටන නම් කුඩා වරායෙන් ශ්‍රී මහා බෝධීන්වහන්සේ රැගෙන ඒම ද, නැගෙනහිර වෙරළේ පිහිටි ලංකාපට්ටන නමින් හැඳින්වෙන කුඩා නැංගුරම් තොටින් ශ්‍රී දන්තධාතුව රැගෙන හේමමාලා සහ දන්ත කුමරුන් මෙරටට පැමිණීම ද ඊට නිදසුන් ය.

**ගුරුවරු** ගුරු වෘත්තිය ද පුරාණ කාලයේ ශ්‍රී ලංකාවේ පැවති තවත් එක් වෘත්තියකි. ගුරුවරු හැඳින්වීමට පැරණි ලේඛනවල යොදා තිබෙන්නේ ආචාර්ය යන පදය යි. ශිල්ප ඉගැන්වූ පුද්ගලයින් පමණක් නොව ශිල්ප ශාස්ත්‍රවල නිපුණව සිටි පුද්ගලයින් ද ආචාර්ය යන නමින් හැඳින්විණි. මෙම ආචාර්යවරු විවිධ ශිල්පවල සමත්කම් දැක්වූහ. ඒ අතර ඇතුන් හීලෑ කිරීම ඉගැන්වූ ගුරුවරු (හස්ති ආචාර්ය), අශ්වයින් පිට යාම පුරුදු කළ ගුරුවරු (අශ්ව ආචාර්ය), සහ දුන්නෙන් විදීම පුහුණු කළ ගුරුවරු (දුනු ආචාර්ය) ගැන තොරතුරු සෙල්ලිපිවල සඳහන් ය.

**වෛද්‍ය වෘත්තිය** සමාජයක් හොඳින් පවත්වා ගෙන යාමට නම් ඊට අයත් වැසියන් නිරෝගිව සිටීම අත්‍යවශ්‍ය ය. ඒ සඳහා වෛද්‍යවරුන්ගේ සේවය ඉතා වැදගත් වේ. අනුරාධපුර යුගයේ මුල් අවධියේ මෙරට සමාජය වෛද්‍ය වෘත්තිය මහත් ඉහළින් පිළිගෙන තිබේ. වෛද්‍යවරුන් හැඳින්වීමට සෙල්ලිපිවල යොදා තිබෙන්නේ *වෙජ* යන පදය යි. ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවසේ දී ඇතැම් වෛද්‍යවරු මහවෙදනා නමින් හඳුන්වා දී තිබේ. එවැනි ව්‍යවහාරයක් භාවිත කරන ලද්දේ ප්‍රධාන වෛද්‍යවරයා හෝ ශල්‍ය වෛද්‍යවරු හැඳින්වීමට ය.

**නීතිවිශාරදයෝ**- මීට අවුරුදු 2000 කට පමණ පෙර පැවති නීතිය සම්බන්ධයෙන් හසල දැනුමක් තිබූ වෘත්තිකයෝ විසූහ. බෙහෝ විට ඔවුන් යුක්තිය පසිඳලීමට රජු ට අවශ්‍ය කරන උපදෙස් දීමට කටයුතු කළ බව පෙනේ. නීතිය ගැන දත් එවැනි පුද්ගලයින් හඳුන්වන ලද්දේ 'වොහාර' යන නමිනි. එය සංස්කෘත භාෂාවට අයත් ව්‍යවහාර යන වචනයෙන් සකස් වූවකි. තත්කාලීන සමාජයේ යුක්තිගරුක යහපත් දේ යැයි සම්මත ව්‍යවහාර සම්බන්ධයෙන් ප්‍රවීණත්වයක් මෙම පුද්ගලයින්ට හිමිව තිබිණි.

**විවිධ ශිල්පීන්** නෙකවිධ කර්මාන්තවල සහ කලාත්මක වෘත්තීන්වල යෙදුණු පුද්ගලයෝ පැරණි කාලයේ මෙරට සමාජයේ ජීවත් වූහ. කලාකරුවන්

අතර නැට්ටුවන්, චිත්‍ර අඳින්නන් සහ කවියන් පිළිබඳ තොරතුරු මූලාශ්‍රයවල සඳහන් වේ. කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් මැදගම පිහිටි පුරාණ විහාරයක මීට අවුරුදු 2200 කට පමණ ඉහත දී කොටවන ලද සෙල්ලිපියක තිස්ස නමින් හැඳින්වූ නැට්ටුවෙකු ගැන සඳහන් වේ. මෙම නැට්ටුවාගේ බිරිඳ පරුමකවරියක් ලෙස හඳුන්වා දී තිබීම මෙහි දී වැදගත් කරුණකි. මෙයින් අපට පැහැදිලි වන්නේ නැටීමේ වෘත්තිය සමාජයේ වැදගත් තැනක ලා එකල සලකා තිබෙන බව යි. සිත්තරුන් හැඳින්වීම සඳහා 'චිතකර' යන පදයත් 'ලපන' යන පදයත් භාවිත කර ඇත. පළමුවන වචනය චිත්‍රකාර යන පදයෙන් ද දෙවන වචනය ලේපන යන වචනයෙන් සකස් වී තිබේ. සංස්කෘත භාෂාවේ ලේපන යන පදය භාවිත වන්නේ ආලේපනය යන තේරුම දීම සඳහා ය. වර්ණ ආලේප කිරීමෙන් චිත්‍ර නිර්මාණය වන නිසා සිත්තරුවන් හැඳින්වීමට ලේපන යන පදය යොදා තිබේ. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් නැට්ටුකන්ද නමින් හැඳින්වෙන ස්ථානයේ තිබෙන සෙල්ලිපියක ලපන තිස්ස නමැත්තෙකු ගැන සඳහන් වේ.

අපේ රටේ ඉතා උසස් නිර්මාණශීලිත්වයකින් යුත් කවියෝ සිටිය හ. ඔවුන් හැඳින්වීමට 'කවි' යන පදය ම යොදා තිබේ. ඉහතින් සඳහන් කළ ලපන තිස්සගේ පුත්‍රයා එම ලිපියේ ම හඳුන්වා දී තිබෙන්නේ කවියෙකු ලෙස ය. ඔහුගේ නම සංජය යි.

## 4.3 සංස්කෘතිය

### 4.3.1 ආගම


ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ දී මිහිඳු මහරහතන් වහන්සේ මෙහි වැඩම කොට බුදුදහම දේශනා කිරීමේ පටන් අනාදිමත් කාලයක් තිස්සේ අඛණ්ඩව බුදුදහම මෙරට ප්‍රධාන ආගම ලෙස පැවතිණි. ඊට අමතරව පසු කාලවල හින්දු ආගමික අදහස් සමාජය තුළ පැතිර ගියේ විශේෂයෙන් ඉන්දියානු සම්භවයක් ඇති වෙළෙඳුන් සහ වෙනත් පිරිස් එහි සිට මෙරටට පැමිණීම නිසා ය. කිතුදහම සහ ඉස්ලාම් ධර්මය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබුවේ බුදුදහම පැතිරී යාමට සාපේක්ෂව ඉතිහාසයේ ඉතා මෑත කාලවකවානුවක දී ය. ඒ වනාහි ක්‍රිස්තු වර්ෂයෙන් හයවන සියවසින් පසු මධ්‍යධරණී ප්‍රදේශය සහ ක්‍රිස්තු වර්ෂයෙන් දහසයවන සියවසින් පසු බටහිර රටවල් කේන්ද්‍ර කර ගත් වෙළෙඳාම පෙරදිග රටවල පැතිරී යාමේ එක් ප්‍රතිඵලයක් ලෙසිනි.



*සිතුවම අංක 4.2 බුදුදහම මෙරටට හඳුන්වාදුන් මුල් කාලයේ පටන් භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කළේ උපාසක උපාසිකාවන් විසින් පූජා කරන ලද ගල්ගුහා ආරාමවල ය. පන්සල් සහ විහාරාරාම ඉදිවූයේ මදක් පසු කාලයක දී ය.*



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*



*ඡායාරූපය අංක 4.3 මිහිඳු හිමියන් මෙරටට වැඩම කළ කාලයේ ම බෞද්ධ ස්වාමීන් වහන්සේලා වෙත සැදැහැත් දායක දායිකාවන් විසින් මෙවැනි ස්වාභාවික ගල්ගුහා පූජා කරන ලදී. කටාරම් කොටා සකස් කරන ලද මෙවැනි ඇතැම් ගල්ගුහාවල එම ගල්ගුහාව පූජා කළ අයගේ නම් ගම් දැක්වෙන සෙල්ලිපියක් ද කොටා තිබේ.*

මිහිඳු මහරහතන්වහන්සේ ප්‍රමුඛ අනුගාමිකයින් කණ්ඩායම මෙරටට වැඩම කරවීමෙන් පසු නොබෝ කලකින් බුදුදහම සහ ඊට තදනුබද්ධ පුදපූජා පිළිවෙත් මෙරට සමාජය තුළ ශීඝ්‍රයෙන් පැතිර ගියේ ය. දිනෙන් දින සංඛ්‍යාත්මක වශයෙන් පුළුල් වන සංඝ සමාජයට වැඩ වාසය කිරීමට සුදුසු ආරාම නොමැති වූයෙන් ස්වාභාවික ගල්ගුහා පිරිසිදු කොට ඒවා උන්වහන්සේලා වෙත පූජා කිරීමට කටයුතු කෙරිණි. දැනට සොයා ගෙන ඇති පරිදි භික්ෂූන් වහන්සේලාට පූජා කරන ලද එවැනි ගල්ගුහා 1600 කට වැඩි ප්‍රමාණයක් රටේ විවිධ පළාත්වල දක්නට තිබේ.

සුදුසු ගල්ගුහාවක් තෝරාගෙන පළමුව එය පිරිසිදු කර, වැසි කාලවල දී පියස්ස දිගේ ගුහාව තුළට ජලය ගලා ඒම වැළැක්වීමට කටාරමක් කොටා පසුව එම ගුහාව භික්ෂූන් වහන්සේ වෙත සඟසතු කොට පූජා කෙරිණි. ඇතැම් ගල්ගුහාවල කටාරමට යටින් එම ගල්ගුහාව පූජා කළ අයගේ විස්තර කොටා තිබෙනු දැකිය හැකි ය. ඒ කාලයේ ඒ සඳහා භාවිත කරන ලද්දේ බ්‍රාහ්මී අක්ෂර යි. එම සෙල්ලිපි ලියා තිබෙන්නේ සිංහල ප්‍රාකෘත නමින් හැඳින්වෙන පැරණි සිංහල භාෂාවෙනි. පාසල් චාරිකාවට සහභාගි වන ඔබට මිහින්තලේ, රිටිගල, වෙස්සගිරිය, සීගිරිය ආදි තැන්වල තිබෙන කටාරම් සහ සෙල්ලිපි කොටන ලද එවැනි ගල්ගුහා නැරඹීමට අවස්ථාවක් ලැබෙනු ඇත. මෙහි පහත දක්වා තිබෙන්නේ මිහින්තලයේ එක් ගල්ගුහාවක එසේ කොටා ඇති සෙල්ලිපියකි.

සෙල්ලිපිය පරුමක ගුත පුත පරුමක සුමනහ ලෙණෙ අගත අනගත චතුදිශ සගස

තේරුම ප්‍රධානියෙකු වූ ගුප්තගේ පුත්‍රයා වන ප්‍රධානි සුමන විසින් (මෙම ගුහාව) මෙහි ආවා වූ ද නො ආවා වූ ද සතර දිශාවේ සංඝයාට (පූජා කරන ලදී).

ගුහාවිහාර හැරුණු විට 'පණ්ණසාලා' නමින් හැඳින් වූ ගොඩනැගිලි විශේෂයක් ගැන මූලාශ්‍රයවල සඳහන් ය. එයින් අදහස් කරන්නේ භික්ෂූන් වහන්සේලාට වාසය කිරීමට පන්, ඉලුක් ආදි දේ සෙවිලි කොට සාදන ලද වරිච්චි නිවාස යි. කළුගල් සහ ගඩොළු භාවිතයෙන් විහාරාරාම ඉදිකිරීමට පෙර භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කළේ එවැනි තැන්වල ය. වර්තමානයේ බෞද්ධ විහාර හැඳින්වීමට අප විසින් භාවිත කරන 'පන්සල' යන වචනය සෑදී තිබෙන්නේ මෙම 'පණ්ණසාලා' යන වචනය වෙනස් වීමෙනි.

පැරණි බෞද්ධ ආරාමවල භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙකු වාසය කළහ. නායක ස්වාමීන් වහන්සේ යටතේ වැඩ වාසය කළ භික්ෂූන් වහන්සේලා හඳුන්වන ලද්දේ 'අන්තේවාසික' භික්ෂූන් ලෙස ය. අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් මහඇලගමුවේ තිබෙන ගල්ගුහාවක කොටා ඇති ලිපියක තිස්සරක්ඛිත නම් වූ තෙරුන්ගේ අතෙවසික පුස්ස නමැත්තෙකු ගැන සඳහන් ය. ඒ කාලයේ නායක ස්වාමීන් වහන්සේලා හඳුන්වන ලද්දේ 'ථෙර' යන නමිනි. එසේ හඳුන්වන ලද නායක තෙරුන් වහන්සේලා සමීපයේ විසූ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සෙල්පිවල නම් කර තිබෙන්නේ 'සදිවිහරිය' යන වචනයෙනි. එහි අදහස සද්ධි විහාරික යන්න යි. එම පදයේ තේරුම 'සමීපයේ වාසය කරන්නා' යනු යි.

වළගම්බා රජුගේ පාලන සමයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන තෙක් ධර්මය රැක ගෙන පැමිණියේ මතක තබා ගැනීමෙනි. ධර්මය ඉතා පුළුල් බැවින් ඉන් කොටස බැගින් මතකයේ තබා ගත් භික්ෂූන්

වහන්සේලා සිටියහ. එවැන්නන් හඳුන්වන ලද්දේ 'භාණකවරු' යන නමිනි. ධර්මයට අයත් ඒ ඒ පිටක මතකයේ තබා ගත් භික්ෂූන් වහන්සේලා අදාළ පිටකයේ නමින් හැඳින්විණි. නිදසුනක් ලෙස දීඝ නිකාය මතක තබා ගත් භික්ෂූන් වහන්සේලා දීඝභාණක නමින් ද සංයුක්ත නිකාය මතක තබා ගත් භික්ෂූන් වහන්සේලා සංයුක්තභාණක නමින් ද හැඳින්වීය.


භික්ෂූන් වහන්සේලාට වස් වැසීමට ආරාධනා කිරීම සහ කඨින උත්සව පැවැත්වීම එකල බෞද්ධ ජනතාව අතර පැවති ගෞරවනීය සිරිතකි. කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් හැලඹගල නමින් හැඳින්වෙන ස්ථානයේ තිබෙන සෙල්ලිපියක 'වසවසික' යන පදය යෙදී තිබේ. එහි තේරුම වස්සාවාසික හෙවත් වස් වසන ලද යන්න යි. එම දිස්ත්‍රික්කයට ම අයත් කොතලකිඹියාවේ තිබෙන තවත් සෙල්ලිපියක 'වසවසික සහඨක' යන යෙදුම දක්නට ඇත. වස්සාවාසික සාටක යන දෙපදය සිංහල ප්‍රාකෘත භාෂාවෙන් ලියා තිබෙන්නේ එලෙස ය. ඉන් අදහස් කරන්නේ කඨින චීවරය යි. උත්තිය නම් වූ තෙරුන් වහන්සේ කෙනෙකුගේ ඥාතීන් විසින් කඨින චීවරයක් පූජා කළ බව එහි කියා තිබේ. මෙම සෙල්ලිපි දෙක ම මීට අවුරුදු 2200 කට ඉහත කාලයකට අයත් ය.

### 4.3.2 වෙනත් ආගම්

බුදුදහම මෙරට සමාජයේ මුල්බැස ගත් අවධියේ අනුරාධපුර නගරය සහ එහි අවට බ්‍රාහ්මණ ජන කණ්ඩායම් වාසය කළ බවට සාක්ෂි තිබේ. ඔවුහු හින්දු භක්තිකයෝ ය. මහාවසංයේ සඳහන්වන සොත්ථිසාලා නමින් එකල හැඳින්වූ ගොඩනැගිලි විශේෂය ගැන විස්තර කරන මහාවංසටීකාව බ්‍රාහ්මණයින් ආගමික කටයුතු කරන තැන් ද එසේ හඳුන්වන ලද බව කියයි. එමෙන් ම සිවිකාසාලා යන වචනය විස්තර කරන එම කෘතිය ඉන් අදහස් කරන ලද්දේ



*ඡායාරූපය අංක 4.4 අනුරාධපුරයෙන් සොයා ගෙන තිබෙන ගල්කණුවක සටහන් කළ කුරුසයක්. මෙය පෘතුගීසීන් මෙරටට පැමිණීමෙන් පසු කාලයට අයත් වූවකි.*



*ඡායාරූපය අංක 4.5 අරාබි ජාතිකයින්ට අයත් පැරණි සොහොන්ගලක කොටා තිබෙන සෙල්ලිපියක්. එහි දැක්වෙන්නේ කියුෆික් අරාබි අක්ෂරවලින් ලියූ ලිපියකි.*

ශිව ලිංග පිහිටුවා තිබූ තැන් බව පෙන්වා දෙයි. ශිව දෙවියන් වෙනුවෙන් කරන එම පූජාව හින්දු භක්තිකයන් අතර ප්‍රචලිත ය. දකුණු ඉන්දියාව ශ්‍රී ලංකාවට සමීපව පිහිටා තිබීමත් දෙරට අතර වෙළෙඳ සබඳතා අඛණ්ඩව පැවතීමත් හේතුවෙන් හින්දු ආගමික අදහස් මෙරටට ගලා ආවේ ය. වෙළෙඳාම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි දෙමළ ජාතික වෙළෙඳුන් ගැන මෙරට පැරණිතම සෙල්ලිපිවල සඳහන් ය. එම ලේඛනවල ඔවුන් හඳුන්වා තිබෙන්නේ 'දමෙඩ' යන නමිනි. ඒ ද්‍රවිඩ යන වචනය සිංහල ප්‍රාකෘත භාෂාවෙන් ලියූ ආකාරය යි. ක්‍රිස්තු වර්ෂයෙන් හත්වන සියවස වන විට මෙරට ප්‍රධාන වරායන් ආශ්‍රිතව සැලකිය යුතු තරමේ දෙමළ ප්‍රජාවක් වාසය කළ හ. මාතොට වරායට සමීපව ඉදි කොට තිබෙන තිරුකේතීශ්වරම් හින්දු කෝවිලත් ත්‍රිකුණාමලයේ පිහිටි පැරණි ගෝකණ්ණතිත්ථ වරායට සමීපව ඉදි කර තිබෙන කෝණේශ්වරම් කෝවිලත් ඒ කාලයේ එහි විසූ දෙමළ ජනතාවගේ වන්දනාමානයට ලක් වූ තැන් ය.




*ඡායාරූපය අංක 4.6 පොළොන්නරුවේ පිහිටි පැරණි ශිවදේවාලයක්*


කුරුසයක් සටහන් කළ පැරණි ගල් පුවරුවක් අනුරාධපුරයෙන් සොයා ගෙන තිබේ. එම කුරුසය අයත් වන්නේ කතෝලික නිකායක් වූ නෙස්ටෝරියානුවන්ට ය. පසුකලෙක පර්සියාව කේන්ද්‍ර කොට ගෙන වර්ධනය වූ නෙස්ටෝරියානු නිකායට අයත් අදහස් තිබෙන වෙළෙන්දෝ වෙළෙඳ මාර්ග හරහා ශ්‍රී ලංකාවට ද පැමිණියෝ ය. ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසට අයත් දේශාටකයෙකු වූ කොස්මොස් ඉන්ඩිකොප්ලේටස් අනුරාධපුරයේ විසූ පර්සියානු ජාතික වෙළෙඳුන් කණ්ඩායමක් ගැන සඳහන් කර තිබේ.

අනුරාධපුරයෙන් සොයා ගන්නා ලද නෙස්ටෝරියානු කුරුසය සටහන් කරන ලද ගල් පුවරුව පෘතුගීසි ජාතිකයින් මෙරටට පැමිණි පසු නිම කළ එකක් බව විද්වතුන්ගේ මතය යි.

ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවසින් පසුකාලයේ ඉස්ලාම් ආගමට අයත් අදහස් ශ්‍රී ලංකාවේ පැවති බව පෙන්වීමට සාක්ෂි තිබේ. දැනට සොයා ගෙන තිබෙන පැරණිතම අරාබි භූගෝල විද්‍යා ග්‍රන්ථය වූ කිතබ් අල්මස්ලික්වාල්මමාලික් කෘතියේ 'සරන්ඩිබ්' යනුවෙන් ශ්‍රී ලංකාව ගැන සඳහන් කර තිබේ. සරන්ඩිබ් යනු සිංහලද්වීප යන වචනය අරාබි ජාතිකයින් විසින් උච්චාරණය කළ ආකාරය යි. මෙම කෘතිය රචනා කරන ලද්දේ ක්‍රිස්තු වර්ෂ 845 දී හෝ ඒ ආසන්න කාලයක දී ය. අරාබියත් ශ්‍රී ලංකාවත් අතර පැරණි කාලයක පටන් ඉතා සුහද සබඳතාවක් ගොඩ නැගෙමින් තිබිණි. හුදෙක් ම එය වෙළෙඳ සබඳතාවල ස්වරූපය ඉක්මවූවකි. ඉස්ලාම් ආගමික නායක ශුද්ධ වූ මුහම්මත්තුමන් ජීවමාන කාලයේ උන්වහන්සේගේ ධර්මය කුමක් දැයි සැක හැර දැන ගනු පිණිස සරන්ඩිබ්හි කණ්ඩායමක් අරාබියට පැමිණි බව ඉබ්න් ශහ්රියර් නමැත්තෙකු විසින් ක්‍රිස්තු වර්ෂයෙන් 953 දී රචනා කරන ලද අජායිබ් අල්හින්ද් නම් කෘතියේ සඳහන් කර තිබේ. බැග්ඩෑඩ් නගරය කේන්ද්‍ර කොට ගෙන



*ඡායාරූපය අංක 4.7 සීගිරි කැටපත් පවුරේ ලියා ඇති කුරුටු ගීයක්. මෙහි අක්ෂර ක්‍රිස්තු වර්ෂ අටවන හෝ නමවන සියවසට අයත්ය. එය ආරම්භ වන්නේ 'කොණණතල්මි ලීමි' යන දෙපදයෙනි. එහි අරුත මම කොණණතල් වෙමි. මා විසින් මෙය ලියන ලදී යන්න යි.*



*ඡායාරූපය අංක 4.8  සීගිරි පර්වත බෙයදෙ සිතුවම් කර ඇති සීගිරි අප්සරාවෝ. මෙය ක්‍රිස්තු වර්ෂයෙන් පස්වන ශතවර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පැවති රාජසභා කලාවේ ස්වභාවය පෙන්නුම් කරයි. මේ චිත්‍රවලින් දක්වෙන්නේ විජ්ජුලතාවන් සහ මේසලතාවන් බව විද්වතුන්ගේ අදහස යි. ඉන් විදුලිය සහ වැසි වලාකුළු නිරූපිත ය.*

අබ්බාසීද්වරුන්ගේ මූලිකත්වයෙන් ආරම්භ වූ මුස්ලිම් වාණිජ ආධිපත්‍යය ක්‍රිස්තු වර්ෂ 751-1258 අතර කාලය තුළ දී ආසියාවේ පැතිර ගියේ ය. අන්තර්ජාතික වෙළෙඳ කටයුතු හොඳින් පවත්වා ගෙන යාම අවශ්‍ය වූ හෙයින් ශ්‍රී ලංකාවේ පාලකයන් ඒ සඳහා නිශ්චිත ක්‍රියා මාර්ග ගත් බව ක්‍රිස්තු වර්ෂ නවවන සියවසේ ජීවත් වූ අල්බලසූරි නම් අරාබි ජාතික ඉතිහාසඥයා සඳහන් කර තිබේ.

### 4.3.3 අධ්‍යාපනය

දැනුම ලබා ගැනීම සහ දැනුම පතළ කිරීමට අදාළ වන සංවිධානාත්මක ක්‍රමවේදයක් ඉතා පුරාණ කාලයක සිට මෙරට පැවතිණි. මුල් අවස්ථාවේ දී පරම්පරාවෙන් පරම්පරාවට ඒ දැනුම හුවමාරු වූයේ අභ්‍යාස කිරීම සහ අසා දැන ගැනීම මගින් බව පෙනේ. මීට අවුරුදු 4400 කට ඉහත කාලවකවානුවකදී පටන් තැන් කිහිපයක ඉදි කරන ලද මැටි ඔරු සොහොන්, ඒවා තුළ භෂ්මාවශේෂ තැන්පත් කළ මැටි භාණ්ඩ ආදි දේවල දක්නට තිබෙන ශෛලියේ සහ නිමාවේ සමානකම් දෙස අවධානය යොමු කරන විට ඒවා නිපදවීමට අදාළ තාක්ෂණය පිළිබඳ දැනුම සංවිධානාත්මකව සකස් වී තිබුණු බව ස්ථිරව පෙනේ.

මෙම පාඩමේ ඉහත අවස්ථාවක දී සඳහන් කළ අන්දමට අපේ රටේ පැරණිතම සෙල්ලිපිවල අචරිය යන පදයෙන් හඳුන්වන ලද පිරිස ගුරුවරුන් ය. ඒ ගුරුවරු විසින් උගන්වන ලද දේ පිළිබඳව ඔවුන් හඳුන්වා දී ඇති තැන්වල ම සඳහන් ය. ඇතැමුන් ධනු අචරිය යනුවෙන් ද තවත් අය හති අචරිය සහ අස අචරිය යනුවෙන් ද හඳුන්වා දී තිබේ. ඔවුන් පිළිවෙළින් දුනු විදීමේ ශිල්පය, ඇතුන් හැසිරවීම සහ අශ්වයින් හැසිරවීම පිළිබඳ ශිල්ප ඉගැන්වූ ගුරුවරුන් ය.

බුදුදහම මෙරට සමාජයේ මුල්බැස ගැනීමෙන් අනතුරුව ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථාන බවට පත් වූයේ බෞද්ධ විහාරාරාම යි. ඒවායේ වැඩ විසූ වියත් භික්ෂූන් වහන්සේලා සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

ආදි භාෂාවල පමණක් නොව බුදුදහම පිළිබඳව ද හසල දැනුමකින් යුතු විය. පුරාණ කාලයක සිට මෙරට මුල් පෙළේ ගුරුවරුන් ලෙස කටයුතු කළේ උන්වහන්සේලා යි.

පැරණි කාලයේ දී අනුරාධපුරයේ පැවති මහාවිහාරය සහ අභයගිරිය යන බෞද්ධ මධ්‍යස්ථාන ආගමික ස්ථාන මෙන්ම අධ්‍යාපන ආයතන ලෙස ද ක්‍රියාත්මක විය. විදේශික භික්ෂූන් වහන්සේලා පවා මෙම ආයතනවල ඉගෙන ගැනීමට වැඩම කළහ. ත්‍රිපිටක ධර්මයට වැඩි විස්තර සහිත අටුවා රචනා කළ බුද්ධඝෝෂ හිමි එලෙස මහාවිහාරයේ අධ්‍යයන කටයුතු කළ විදේශික භික්ෂූන් වහන්සේ නමකි.

අධ්‍යාපනය ලබාදීමත් අධ්‍යාපනය ලබා ගැනීමත් සම්බන්ධයෙන් අපේ පැරණි සමාජය තුළ පැවතියේ ගෞරවණීය හැඟීමකි. ලෝකෝපකාරයේ සඳහන් වන පහත සඳහන් කවිය ඊට කදිම නිදසුනකි.

රූ සිරි යොවුන් ගුණ නැණ සියල්ලෙන් නො අඩු වී මුත්

නො දතොත් සිල්ප සත  සුවඳ නැති කැල මල සම වේ

එම කවියෙන් කියවෙන්නේ යමෙක් රූපයෙන්, යෞවන ගුණයෙන් සහ ඥානයෙන් යුක්ත වුවත් ඔහු හෝ ඇය යම් ශිල්ප ශාස්ත්‍රයක් නොදන්නේ නම් සුවඳ නොමැති කැල මලකට සමාන වන බවයි.

### 4.3.4 සාහිත්‍යය සහ රසාස්වාදය

කවියෙකු විසින් මීට වසර 2000 කට පමණ ඉහත ලියන ලද කවියක් කිරින්ද පන්සලේ තිබෙන ගල් පර්වතයක කොටා තිබේ. එය රිද්මයකට කියැවිය හැකි නිසඳැස් කවියකි. ඒ කවියත් එහි සිංහල පරිවර්තනයත් පහත දැක්වෙන පරිදි ය.

***ගලේ ලියා ඇති කවිය***

*අපරිමිතෙ ලොකහි  බුධ සමෙ නති*
*අථාන පරම දුලබෙ  සවනුතෙ පතෙ*
*අනුතරෙ සතෙ  මහ සරණෙ*
*ලොකචක බුධ නම සයබු  මෙගලහි විහරේ*
*නක උවරජ නම  බුධ සරණ ගතෙ*
*මිචදිටික බිදිය  යහමග පරයන භුතෙ*

**එහි පරිවර්තනය**

*අපරිමිත මෙලොව  බුදුන් සම සරණක් නැත*
*එ හිමි සැමතැනය  එ සම වනු දුලබ දෙයකි*

*මහා සරණකි  කිසිවකුට නොදෙවෙනි*
*තමාම සියල් දත් එහිමි  ලොවටම ඇසකි*

*මිසදිටුකම අතැර  යහමග යනු රිසිව*
*මේ ගලේ විහාරෙදී  බුදුසරණ වැළඳ ගති නාග උපරජ තෙම*

අනුරාධපුර යුගයේ රචනා වූ කවි 600 කට ආසන්න ප්‍රමාණයක් සීගිරියේ කැටපත් පවුරේ අදත් දකින්නට තිබේ. ඒ කවිවල ආස්වාදජනක ගුණය ඉතා ඉහළ ය.

පුරාණ කාලයේ අපේ රටේ විසූ කවියෝ බුදුදහමින් ලද හික්මීමත් ස්වභාවධර්මය සමග නිරන්තරයෙන් කටයුතු කිරීමෙන් ලබා ගත් අත්දැකීමත් පදනම් කොට ගෙන කාව්‍යකරණයේ නිරත වූහ. එහෙයින් ලෝකයේ පවතින අනිත්‍යතාව බොහෝ කවිවලට තේමාව වී තිබේ. අනුරාධපුර අභයගිරි විහාර භූමියෙන් සොයා ගෙන තිබෙන, ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවසට අයත් සෙල්ලිපියක එවැනි සිත්ගන්නා සුලු කවියක් ලියා තිබේ. එම කවියේ යොදා තිබෙන උපමා ආදිය ඉතාමත් සංවේදී සියුම් සෞන්දර්යාත්මක හැඟීමක් අසන්නා තුළ ජනිත කරවීමට සමත් ය. ජීවිතය ලැව්ගින්නකට හසු වූ වරා මලක් සේ අස්ථිර යැ යි එහි කියා තිබේ.

පහත දැක්වෙන සීගිරි කුරුටු ගීය කියවා එහි තේරුම වටහා ගෙන රසාස්වාදය කිරීමෙන් පැරණි ශ්‍රී ලාංකිකයින්ගේ සෞන්දර්යාත්මක සිතිවිලි කෙබඳු දැ යි ඔබට පහසුවෙන් වටහා ගත හැකි වනු ඇත.

*විජු රක්බෝ පැවිජ්ජන් ලී මෙ ගී*
*නෙලෙන් වී පිරිපත*
*නළල කෙහෙ පිටිහි හුණ*

*මලදම ගැනැ විසිර*
*බියපත් වැ අප බෙයඳ නැගියෙ*

**පරිවර්තනය**

*වජ්‍ර අග්ගබෝධි පැවිද්දා විසින්*
*ලියූ ගීය යි*
*මේ පර්වතය නගින විට*
*සුළඟින් අපට බාධා ඇති විය*
*නළලෙහි වූ කෙස්රොද*
*සුළඟ නිසා පිටට වැටිණි*
*ගෙලෙහි පැළඳ සිටි මල්මාලය ද විසිර ගියේය*
*අපි ඉන් බියට පත් වූයෙමු.*

දීර්ඝකාලීනව ගොවිතැන් කටයුතුවලත් සත්ත්ව පාලනයේත් යෙදී සිටීම නිසා අපේ මුතුන්මිත්තන්ට ස්වභාව ධර්මය සමග සමීපව කටයුතු කිරීමේ අවස්ථාව උදා විය. එහෙයින් ස්වභාව ධර්මයේ තිබෙන සුන්දර බවත් අනිත්‍ය බවත් යන ලක්ෂණ දෙක පිළිබඳ සරල එහෙත් ගැඹුරු වැටහීමක් ඔවුන් සතුව තිබිණි. බුදුදහමේ ඉගැන්වීම් නිසා ඒ අදහස් තවදුරටත් දියුණු වීමෙන් උසස් නිරාමිෂ ගුණයෙන් යුත් රසඥතාවක් පැරණි සමාජය තුළ වර්ධනය විය.

### 4.3.5 වාර්ගික සහජීවනය

ඉතාමත් ඈත කාලයක සිට අපේ රටේ නගරවල විවිධ සංස්කෘතීන්ට අයත් ජනතාව වාසය කළ බවට සාක්ෂි තිබේ. මේ රටේ ජීවත් වූ ස්වදේශික සිංහල ජනතාව හැරුණු විට වෙළෙඳාමට මෙහි පැමිණි වෙනත් ආගම් ඇදහූ වෙනත් සංස්කෘතීන්ට අයත් ජන කණ්ඩායම් නාගරික ප්‍රජාව අතර සිටි බව සෙල්ලිපි මඟින් පෙන්වා දෙයි. ඒ අතර දකුණු ඉන්දියාවෙන් මෙහි පැමිණි දෙමළ වෙළෙන්දෝ, ග්‍රීක් සහ මැසිඩෝනියන් ප්‍රදේශවලින් පැමිණි අයෝනියන්වරු, ඇෆ්ඝනිස්ථාන් ප්‍රදේශයෙන් පැමිණි කාම්බෝජවරු, මලයානු අර්ධද්වීපයෙන් පැමිණි ජාවකවරු ඒ අතර වූහ.

එකී ජාතීන් අතර කොපමණ විවිධත්වයක් පැවතිය ද කවර අවස්ථාවකදීවත් ඔවුන් එකිනෙකා සමග කලකෝලාහල කර ගැනීමට උත්සාහ දරා නැත. බුද්ධශාසනයේ පැවිදිව සිටි දෙමළ ජාතික භික්ෂූන් වහන්සේ කෙනෙකු ගැන සඳහනක් අනුරාධපුරයේ අභයගිරි විහාරයෙන් සොයා ගන්නා ලද සෙල්ලිපියක සඳහන් ය. එම සෙල්ලිපිය ක්‍රිස්තු පූර්ව 250 දී පමණ රචනා කරන ලද්දකි. අන්‍ය ජාතීන් දෙස සැක මුසු ලෙස දකින්නට පුරාණ කාලයේ මෙරට වැසියන් පුරුදු වී සිටියේ නැත. ඒ වෙනුවට අන්‍යජාතීන් සමඟ සුහද ලෙස ජීවත් වීමට ඔවුහු කටයුතු කළ හ. දෙමළ ජාතික පුරුෂයෙකු සමග විවාහ වූ සිංහල කාන්තාවක් ගැන අම්පාර දිස්ත්‍රික්කයෙන් සොයා ගන්නා ලද ඉතා පැරණි සෙල්ලිපියක සඳහන්ව තිබේ. පැරණි කාලයේ දෙමළ ජාතික පවුල් කිහිපයක් පදිංචිව සිටි වීදියක් අනුරාධපුරයෙන් සොයා ගැනීමට ද පුරාවිද්‍යාඥයෝ සමත් වූහ.

ඉන්දියානු සාගරය අවට කලාපයේ පිහිටි නොයෙක් රටවලින් පැමිණි වෙළෙඳ ජනයා ශ්‍රී ලංකාවේ පැරණි නගරවල වාසය කළහ. එසේ වුව ද ඒ අතරින් වැඩිමනක් පිරිසක් පැමිණියේ දකුණු ඉන්දියාවෙන් බව පෙනේ. ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවස වන විට මෙරට රාජසභාවේ 'දෙමළ අධිකාරී' නමින් හැඳින්වූ විශේෂ තනතුරක් තිබිණි. ඔහුගේ කාර්යය වූයේ අනුරාධපුරය සහ ඒ අවට වාසය කළ දෙමළ ජනයාගේ සුභසාධන කටයුතු සොයා බැලීම විය යුතු ය. දෙමෙළ් අධිකාරී පාඬිරද් නමැත්තෙකු පිළිබඳ කොළඹ ජාතික කෞතුකාගාරයේ තිබෙන හතරවන කාශ්‍යප රජතුමාගේ සෙල්ලිපියක සඳහන් වේ. වෙළෙඳුන් හැරුණු විට මේ දෙමළ ප්‍රජාව අතර වැඩිදෙනෙක් අපේ රටේ යුද හමුදාවේ සේවය කළ කුලී හටයෝ වෙති. එලෙස දකුණු ඉන්දියානු කුලී හේවායින්ගේ සහය පැතූ පැරණිතම ශ්‍රී ලාංකික පාලකයින් නම් ඉළනාග රජු (ක්‍රි.ව 3343) සහ අභයනාග රජු ය. (ක්‍රි.ව 231240). කේරල දේශයෙන් පැමිණි ඔවුන් හඳුන්වන ලද්දේ 'අගම්පඩි සේනාව' යනුවෙනි. පළමුවන විජයබාහු රජතුමා දළදා මාලිගයේ ආරක්ෂාව වේලයික්කාර හමුදාවකට භාර කරන ලද බව ශිලාලිපිවල දැක්වේ. වේලයික්කාර යනු කේරළයෙන් මෙහි පැමිණි අගම්පඩි පිරිසකි.

ක්‍රිස්තු වර්ෂයෙන් එකොළොස්වන සහ දොළොස්වන සියවස්වල දී මෙරට වෙළෙඳ කටයුතුවලට සහභාගිව සිටි 'නානාදේසීන්' යනුවෙන් හඳුන්වන ලද වෙළෙඳ කණ්ඩායම දකුණු ඉන්දියානු සම්භවයකින් යුත් පිරිසකි. ඔවුන්ට අයත්ව තිබූ ලෝකඩ මුද්‍රාවක් හම්බන්තොටින් සොයා ගෙන තිබේ. නානාදේසීන් යනුවෙන් හඳුන්වන ලද ඒ වෙළෙඳ පිරිසට අයත් රේගු මුරපළක් ගැන සඳහන් වන ලීලාවතී රැජිනගේ කාලයේ ලියවන ලද සෙල්ලිපියක් අනුරාධපුරයෙන් සොයා ගෙන තිබේ. මෙම පිරිස් ඉතා සාමකාමී ලෙස තම වැඩකටයුතු කරගෙන ගිය බවත් ඔවුන්ගේ ආරක්ෂාව සහ සුභසාධනයට එවක පාලකයින්ගෙන් නොමඳ සහයක් ලැබුණු බව ද ඓතිහාසික වාර්තා අනුව පෙනේ.

දෙමළ ජාතිකයින් සමග පමණක් නොව ඉස්ලාම් ආගම අදහන අරාබි ජාතිකයින් සමඟ ද ඉතා සුහද ව

වැඩ කටයුතු කරගෙන යාමට අපේ රටේ වැසියෝ පුරුදු වී සිටිය හ. බුදුන් වහන්සේගේ ස්පර්ශයෙන් පූජාවට ලක් වූ ශ්‍රී පාදය මෙරට බෞද්ධ වැසියන්ගේ පූජනීය මුදුන්මල් කඩකි. ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවසේ පටන් සමනල කන්ද මුස්ලිම් බැතිමතුන්ගේ ද වන්දනාවට ලක් වූයේ එය 'ආදම්ගේ කන්ද' යන විශ්වාසය පදනම් කොට ගෙන ය. ක්‍රිස්තු වර්ෂයෙන් 850 දී සුලෙයිමාන් නමැති දේශ ගවේෂකයකු මෙන් ම වෙළෙන්දෙකු වූ තැනැත්තෙකු ශ්‍රී පාදය වන්දනා කිරීමට පැමිණි බව සඳහන් ය. ඒ කිසිදු තැනැත්තෙකුට මෙරට වැසියන්ගෙන් හෝ රජයෙන් කිසිදු බාධාවක් ඇති නොවිණි.

පැරණි කාලයේ විසූ මෙරට පාලකයින් මෙන් ම රටවැසියා ද නිරන්තරයෙන් කල්පනා කරන ලද්දේ රටේ දියුණුව වෙනුවෙන් සියලු දෙනා සමඟ සහජීවනයෙන් කටයුතු කළ හැක්කේ කෙසේ ද යන කාරණය යි. රටේ එක්සත් බව සහ බෞද්ධාගමේ චිරස්ථිතිය ආරක්ෂාව වෙත අභියෝග එල්ල නොවන සෑම අවස්ථාවක දී ම ඒ සහජීවනය හොඳින් ආරක්ෂා වී පැවතිණි. අන්‍ය ජාතීන් සහ අන්‍ය ආගම් ඉවසා දරා ගැනීමට මෙරට වාසය කළ සිංහල බෞද්ධ ජනතාව සෑම අවස්ථාවක ම ක්‍රියා කළ ආකාරය සෑම කාලයකට ම ආදර්ශවත් බව නිතර සිහි කළ යුතු ය.

**ක්‍රියාකාරකම 1**

ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ පාලන සංවිධානය, ආගම, සාහිත්‍ය යන ක්ෂේත්‍ර ඇතුළත් වන පරිදි පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

**ක්‍රියාකාරකම 2**

ශ්‍රී ලංකාවේ පැරණි සමාජය ඇසුරින් කෙටි ප්‍රශ්න හා පිළිතුරු පොතක් සකස් කරන්න.

## වැදගත් කරුණු

1. පුරාණ කාලයේ ශ්‍රී ලංකාවේ පාලන කටයුතු විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය යනුවෙන් ආයතන තුනක් මඟින් ක්‍රියාත්මක විය. රජු සහ රජු වෙනුවෙන් ක්‍රියා කළ රජයේ නිලධාරීන් විධායකයට අයත් වූ අතර රාජ සභාව සාකච්ඡා මාර්ගයෙන් තීරණ ගත්තේය.

2. කලාතුරකින් අවස්ථාවක හැරුණු විට අන් සෑම අවස්ථාවක දී ම අපේ පැරණි පාලකයෝ නම්‍යශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළහ.

3. අපේ පැරණි සමාජයේ විවිධ වෘත්තීන්හි නියැළුණු පුද්ගලයෝ ජීවත් වූහ. සමාජය වඩාත් කාර්යක්ෂම කිරීමටත් එමගින් වැසියන්ගේ ජීවිතය වඩාත් පහසු කරවීමටත් ඔවුන් සැමදෙනෙක්ම සමාජයට මහත් මෙහෙවරක් ඉටු කළෝ ය.

4. ඉතා පුරාණ කාලයක සිට ගොවිතැන සහ පශුපාලනය මෙරට බහුතර වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ලෙස පැවතිණි.

5. පැරණි ශ්‍රී ලාංකිකයෝ ඉතා උසස් මට්ටමේ කලාත්මක සෞන්දර්යයක් සහ සාහිත්‍ය රසාස්වාදයක් කෙරෙහි නැඹුරුවක් තිබෙන පිරිසක් ලෙස කටයුතු කළහ. ඔවුන්ගේ නිර්මාණ කුසලතාව සහ ප්‍රතිභා ඥානය ඉතා ඉහළ මට්ටමක පැවති බව සනාථ කර පෙන්වීමට සාක්ෂි තිබේ.

6. පැරණි කාලයේ මෙරට පැවති බුදුදහම ගැඹුරු දර්ශනයක් ලෙස මෙන් ම මහජනයාගේ භක්තිය සහ ශ්‍රද්ධාව පිළිබිඹු කරන නොයෙකුත් ක්‍රියාකාරකම්වලින් ද යුක්තව පැවතිණි. එකල බෞද්ධ ස්වාමීන් වහන්සේලා සහ මහජනතාව අතර ඉතා සමීප සුහද ගෞරවාන්විත සබඳතාවක් පැවතිණි.

7. බුදුදහම හැරුණු විට කාලයෙන් කාලයට වෙනත් ආගමික අදහස් ද මෙරට සමාජය තුළ පැතිරී ගියේය. ශ්‍රී ලංකාව දූපතක් වීමත් ඉතා ඈත කාලයක සිට ඉන්දියානු සාගරයේ වෙළෙඳ කටයුතුවලට සක්‍රීය ලෙස සහභාගි වීමත් යන කරුණු පදනම් කොට ගෙන වෙනත් ආගමික අදහස් මෙරට ව්‍යාප්ත විය.

8. අන්‍ය සංස්කෘතීන්ට අයත් ජන කණ්ඩායම් සමඟ සුහදශීලීව ජීවත් වීම අපේ රටේ ඉතිහාසය තුළ කැපී පෙනෙන ලක්ෂණයකි.



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

පධානසර  මේ නමින් හැඳින්වෙන්නේ පැරණි කාලයේ දී බෞද්ධ භික්ෂූන් වහන්සේලා ගැඹුරු භාවනාවල යෙදීම සඳහා භාවිත කර තිබෙන ගොඩනැගිලි විශේෂයකි. හාත්පස දියඅගලකින් සමන්විත ගොඩනැගිලි දෙකක් කුඩා පාලමකින් සම්බන්ධ කොට පධානසර ඉදි කර තිබේ. වසභ රජතුමා විසින් පිහිටුවන ලද පෙරිමියම්කුලම් සෙල්ලිපියේ සුදස්සන නම් පධානසරයක් ගැන සඳහන් වී තිබේ. මෙවැනි පධානසර රිටිගල, මානාකන්ද, අනුරාධපුර යන ස්ථානවල දැකිය හැකිය. පධානසර හැඳින්වීමට ද්විත්ව වේදිකා ගොඩනැගිලි යන යෙදුම ද භාවිත වේ.

පූගය  සංස්කෘත භාෂාවේ පූග යන වචනයෙන් අදහස් කරන්නේ සභාව හෝ කිසියම් පිරිසකගෙන් සමන්විත මණ්ඩලය යි. ශ්‍රී ලංකාවේ පැරණි සෙල්ලිපිවල පූග යන වචනය වෙළෙඳුන්ගේ සභා හැඳින්වීමට යොදා තිබේ. පූග යන වචනයට සමානව නියමස්ථාන (නියමතන) යන පදය ද සෙල්ලිපිවල යෙදී තිබේ.

කියුෆික් අරාබි අක්ෂර කියුෆික් යන වචනයෙන් අදහස් කර තිබෙන්නේ විවිධ අරාබි අකුරුවල මුල් ම ස්වරූපය යි. එම අක්ෂර ශෛලිය වර්ධනය වූයේ ක්‍රිස්තු වර්ෂයෙන් හත්වන සියවසේ දී ඉරාකයේ කූෆා නගරය කේන්ද්‍ර කර ගනිමිනි. ඉස්ලාම් භක්තිකයින්ගේ ආගමික ග්‍රන්ථය ලෙස සැලකෙන ශුද්ධ වූ කුරානය පිටපත් කිරීමට භාවිත කරන ලද්දේ ද කියුෆික් අරාබි අක්ෂරයි. මෙම අක්ෂරවලින් ලියන ලද සොහොන්ගල් කිහිපයක් ශ්‍රී ලංකාවෙන් ද සොයා ගෙන තිබේ.